පේරාදෙණිය, කෘෂිකම් දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
කෘෂිකම්, සංවර්ධන අමාත්‍යාංශය

වෙළුම 7 අංක 4-5 — 2005 ජූලි - ඔක්තෝබර්

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 50 වසරක අඛණ්ඩ වී පර්යේෂණ හා සංවර්ධන වැඩපිළිවෙලෙහි ප්‍රතිඵලයක් ලෙස වී ප්‍රභේද විශාල සංඛ්‍යාවක් මේ වන විට බිහිකර ගොවි ජනතාව අතට පත් කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව සහලින් ස්වයං පෝෂිත වීමේ මට්ටම කරා ළඟාවීමට හැකියාව ලැබී ඇත.

ශ්‍රී ලංකාවේ වී වගා කරන විවිධ පාරිසරික, පාංශු හා දේශගුණ තත්වයනට මෙන්ම ගොවිජනතාවගේ කැමැත්තට සරිලන ලෙස විවිධ ගුණාංගයන්ගෙන් යුක්ත වූ වී ප්‍රභේද විශාල සංඛ්‍යාවක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පසුගිය වසර 50 තුළ නිර්දේශ කර ඇත. කාලානුරූපව මින් සමහර නිර්දේශිත ප්‍රභේදයන් නිර්දේශිත ලැයිස්තුවෙන් ඉවත් කර ඇති අතර ඒ සඳහා වඩාත් දියුණු කරන ලද උසස් තත්වයේ ප්‍රභේද හඳුන්වා දී ඇත.

මෙම කලාපයේ මූලික අරමුණ දැනට නිර්දේශිතව පවත්නා වී ප්‍රභේද පිළිබඳව දැනුවත් කිරීමයි.




## නිර්දේශිත වී ප්‍රභේද

(අ) මාස 3 වයස් කාණ්ඩය

| ප්‍රභේදය | සහල්වල පැහැය | අස්වනු විභවය හෙක්.ටො. | විශේෂ ගුණාංග | * වර්තමාන බිත්තර වී නිෂ්පාදන වැඩසටහනට ඇතුලත් ප්‍රභේද |
|---|---|---|---|---|
| බීජී 300 | සුදු | 7.0 | කොළ පාළුවට සහ බැක්ටීරියා කොළ අංගමාරයට (BLB) ප්‍රතිරෝධිය. දුඹුරු පැළ කීඩෑ හානියට තරමක් ප්‍රතිරෝධී වන අතර අඩු පොහොර ප්‍රමාණයක් භාවිතා කළ ද සාමාන්‍ය තත්වයේ අස්වැන්නක් ලබා දේ. | F/R |
| බීඩබ් 272-6-බී | රතු | 4.0 | ගොයම ඇද වැටීමට ඔරොත්තු දේ. යකඩ විෂවීමට, සහ කොළ පාළුවට මධ්‍යස්ථව ඔරොත්තු දීමක් ඇත. වගුරු සහ අර්ධ වගුරු කුඹුරු වලට සුදුසුය. | F/R |
| බීඩබ් 302 | සුදු | 5.0 | කොළ පාළුවට ඔරොත්තු දේ. පසේ ලවනතාවය හා ආම්ලික තත්ව වලට තරමක් ඔරොත්තු දේ. | |
| ඒටී 303 | රතු | 5.0 | කොළ පාළුවට ප්‍රතිරෝධිය. | F/R |
| බීජී 304 | සුදු | 7.4 | ගොක් මැස්සා, දුඹුරු පැළ කීඩෑවා හා කොළපාට පත්‍ර කීඩෑවාගේ හානියට ද බැක්ටීරියා කොළ අංගමාරයට ද ප්‍රතිරෝධිය. වගාවේ මූලික අවධියේ වේගවත් වර්ධන විලාශයක් පෙන්නුම් කරයි. | F/R |
| බීජී 305 | සුදු | 8.0 | ගොක් මැස්සා, ජෛව දර්ශ I සහ II, දුඹුරු පැල කීඩෑවා, බැක්ටීරියා පත්‍ර අංගමාරය, කොළ පාළුව සඳහා ප්‍රතිරෝධී වේ. | F/R |
| ඒටී 306 | සුදු | 5.5 | බාස්මති ආකාරයේ ගුණාත්මයෙන් යුක්තය. ගාක ඇද වැටීමට ඔරොත්තු දේ. දේ. දුඹුරු පැළ කීඩෑ හානියට ප්‍රතිරෝධී වේ. | F/R |

ජාතික සෞභාග්‍ය උදෙසා කෘෂිකාර්මික අංශයෙන් විශිෂ්ඨ දියුණුවක් අත්කර ගනිමු

(ආ) මාස 3 1/2 වයස් කාණ්ඩය

| ප්‍රභේදය | සහල්වල පැහැය හෙක්.ටො. | අස්වනු විභවය | විශේෂ ගුණාංග | * වර්තමාන බීජ්තර වී නිෂ්පාදන වැඩසටහනට ඇතුලත් ප්‍රභේද |
|---|---|---|---|---|
| බීජී 94-1 | සුදු | 8.5 | දිගටි සහල් සහිත ප්‍රභේදයකි. පොහොර වලට උසස් ප්‍රතිචාරයක් දක්වයි. | F/R |
| බීඩබ් 267-3 | සුදු | 3.5-4 | මධ්‍යස්ථ උසකින් යුක්තය. පහතරට තෙත් කලාපයේ වැලි සහිත හා වගුරු බිම් වලට වඩා සුදුසුය. යකඩ විෂවීමේ තත්වයට ඉතා හොඳින් ඔරොත්තු දෙන අතර කොළ පාළුවට තරමක් ඔරොත්තු දේ. | B |
| බීජී 350 | රතු | 8.5 | අධික පොහොර ප්‍රතිචාරයක් දක්වන දිගටි සහලින් යුතු ප්‍රභේදයකි. ගොක් මැස්සාගේ ජෛව දර්ශය 1 ට ප්‍රතිරෝධීය. | |
| බීඩබ් 351 | රතු | 7.5 | කොළ පාළුවට ප්‍රතිරෝධීය. කොපු අංගමාරයට සහ යකඩ විෂවීමට මධ්‍යස්ථව ඔරොත්තු දේ. වැඩි කැකුළු සහල් ප්‍රමාණයක් ලබාගත හැක. | F/R |
| බීජී 352 | සුදු | 6.0 | කොළ පාළුවට සහ දුඹුරු පැල කීඩෑවාට ප්‍රතිරෝධීය. | F/R |
| ඒටී 353 | රතු | 6.5 | කොළපාළුවට හා බැක්ටීරියා කොළ අංගමාරයට මධ්‍යස්ථව ඔරොත්තු දීමේ හැකියාවක් ඇත. එසේම මෙය ලවණතාවයට හා නිල්වලා ව්‍යාපාරයේ පාංශු ආම්ලිකත්වයට ඔරොත්තු දෙන ප්‍රභේදයකි. | F/R |
| ඒටී 354 | සුදු | 5.0 | ලවන තත්වයනට ඔරොත්තු දේ. ගොයම ඇද වැටීමක් සිදු නොවේ. | F/R |
| එල්ඩී 356 | රතු | 4.5 | බීජ කුඩා රවුම් වේ. බීජවල දුඹුරු පුල්ලි ඇතිවීමේ රෝගයට ප්‍රතිරෝධීය. කොපු අංගමාරයට මධ්‍යස්ථ ලෙස ප්‍රතිරෝධී වේ. යකඩ විෂවීමට ද මධ්‍යස්ථ ලෙස ඔරොත්තු දෙන අතර ගොයම් මැස්සා හානියට ප්‍රතිරෝධීතාවය සහිතය. | F/R |
| බීජී 357 | සුදු | 9.5 | දුඹුරු පැල කීඩෑවා, ගොක් මැස්සා ජෛව දර්ශ I හා II සඳහා ප්‍රතිරෝධී වේ. පැල මැක්කා හානියට මධ්‍යස්ථ ප්‍රතිරෝධී වේ. කොළ පාළුව සඳහා ප්‍රතිරෝධී/මධ්‍යස්ථ ප්‍රතිරෝධී වේ. යකඩ විෂවීමට හා අඩු උෂ්ණත්ව තත්ව වලට මධ්‍යස්ථ ප්‍රතිරෝධී වේ. | F/R |
| බීජී. 358 | සුදු | 9.5 | සම්බා ප්‍රභේදයකි. දුඹුරු පැළ කීඩෑවා, ගොක් මැස්සා ජෛව දර්ශ 1 හා 2 ට ප්‍රතිරෝධී වේ. පැළ මැක්කාගේ හානියට මධ්‍යස්ථ ප්‍රතිරෝධී වේ. කොළපාළු රෝගයට ප්‍රතිරෝධී/මධ්‍යස්ථ ප්‍රතිරෝධී වේ. යකඩ විෂවීමට හා අඩු උෂ්ණත්වයට මධ්‍යස්ථව ප්‍රතිරෝධී වේ. | F/R |
| බීජී. 359 | සුදු | 7.0 | ගොක් මැස්සා ජෛව දර්ශ 1 හා 2 හා කොළ පාළුවට ප්‍රතිරෝධී වේ. යකඩ විෂවීමට මධ්‍යස්ථව ඔරොත්තුදීමේ හැකියාව ඇත. | F/R |
| බීජී 360 | සුදු | 6.5 | ගොක් මැස්සා ජෛව දර්ශ 1 හා 2 ට ප්‍රතිරෝධී වේ. හොඳ ගුණාත්මයෙන් යුතු සහල් සහිතය. කිර සම්බා ලෙස ද හඳුන්වයි. | F/R |
| බීඩබ් 361 | රතු | 5.0 | ගොක මැස්සා, දුඹුරු පැල කීඩෑවා හා කොළ පාළුවට හා යකඩ විෂවීමට මධ්‍යස්ථව ප්‍රතිරෝධී වේ. වැඩි විභවයක් සහිත පහතරට තෙත් කලාපය ප්‍රදේශ සඳහා නිර්දේශ කර ඇත. | F/R |
| ඒටී 362 | රතු | 7.0 | දුඹුරු පැළ කීඩෑවා හා කොළ පාළුවට මධ්‍යස්ථ ප්‍රතිරෝධ වන අතර බැක්ටීරියා කොළ අංගමාරයට මධ්‍යස්ථ ප්‍රතිරෝධී/මධ්‍යස්ථ පාත්‍රී වේ. දිවයින පුරාම වගා කිරිම සඳහා නිර්දේශ කර ඇත. | F/R |
| බීඩබ් 363 | සුදු | 10 | යකඩ විෂවීමට ඔරොත්තු දේ. ගොක් මැස්සා, දුඹුරු පැළ කීඩෑවා සහ කොළ පාළුවට මධ්‍යස්ථ ප්‍රතිරෝධී වේ. බැක්ටීරියා කොළ අංගමාරයට මධ්‍යස්ථ ප්‍රතිරෝධී/ මධ්‍යස්ථ පාත්‍රී වේ. ඇද වැටීමට ඔරොත්තු දේ. | F/R |

(ඇ) මාස 4 වයස් කාණ්ඩය

| ප්‍රභේදය | සහල්වල පැහැය | අස්වනු විභවය හෙක්.ටො. | විශේෂ ගුණාංග | * වර්තමාන බිත්තර වී නිෂ්පාදන වැඩසටහනට ඇතුලත් ප්‍රභේද |
|---|---|---|---|---|
| බිඩබ් 400 | රතු | 4.0 | ලවනතාවයට මධ්‍යස්ථ ලෙස ඔරොත්තු දේ. තෙත් කලාපයට වඩා සුදුසු වේ. වී පොත්ත ආවේනික දුඹුරු වර්ණයකින් යුක්තය. කොළ පාළු රෝගයට ප්‍රතිරෝධි වේ. | - |
| ඒ.ටී. 401 | රතු | 5.0 | ලවනතාවයට ඔරොත්තු දේ. පොක්කාලි නම් වූ ප්‍රභේදය වෙනුවට ආදේශ කළ හැක. ඇද වැටීමට පාත්‍ර නොවේ. | - |
| ඒටී 402 | රතු | 7.5 | පොහොර වලට උසස් ප්‍රතිචාරයක් දක්වයි. දුඹුරු පැළ කීඩැවන්ට සහ කොළ පාළුවට මධ්‍යස්ථ ලෙස ඔරොත්තු දේ. එච්. 4 ප්‍රභේදයට ඉතා හොඳ ආදේශකයකි මධ්‍යස්ථ උසකින් යුක්තය. වී කෙටීමේ දී ලැබෙන නොකැඩුනු ධාන්‍ය ප්‍රතිශතය 65% කට වැඩිය. මෙය හම්බන්තොට හා මාතර ප්‍රදේශ වලට වඩාත් සුදුසුය. | F/R |
| බිජි 403 (මහසෙන්) | සුදු | 8.0 | කොළ පාළුවට සහ බැක්ටීරියා කොළ අංගමාරයට ප්‍රතිරෝධිය. දුඹුරු පැළ කීඩෑ හානියට මධ්‍යස්ථ ලෙස ප්‍රතිරෝධිය. | F/R |
| ඒටී 405 (ලංකා සමෘද්ධි) | සුදු | 5.6 | දුඹුරු පැළ කීඩෑහානියට මධ්‍යස්ථව ප්‍රතිරෝධිය. භාස්මති ආකාරයේ ගුණාත්මයෙන් යුත් සහල් සහිතය. | |

(ඈ) මාස 4 1/2 වයස් කාණ්ඩය

| ප්‍රභේදය | සහල්වල පැහැය | අස්වනු විභවය හෙක්.ටො. | විශේෂ ගුණාංග | * වර්තමාන බිත්තර වී නිෂ්පාදන වැඩසටහනට ඇතුලත් ප්‍රභේද |
|---|---|---|---|---|
| බිජි 379-2 | සුදු | 7-7.5 | දුඹුරු පැළ කීඩැවන්ට ප්‍රතිරෝධිය. පොහොර වලට ඇති ප්‍රතිචාරය උසස්ය. අස්වනු පාගා ගැනීම මදක් දුෂ්කරය. ධාන්‍ය වල බර වැඩිය. බැක්ටීරියා කොළ අංගමාරයට ප්‍රතිරෝධිය. | F/R |
| බිජි 450 | සුදු | 6.0 | සම්බා ප්‍රභේදයකි. මේරූ වහාම ඇට කරලින් වැටීම සිදුවන බැවින් අස්වනු නෙලීම හැකි ඉක්මණින් කළ යුතුය. බිජි 11-11 ප්‍රභේදයට හොඳ ආදේශකයකි. ගොක් මැස්සාගේ ජෛව දර්ශ 1 ට ප්‍රතිරෝධිය. | F/R |
| බිඩබ් 451 | සුදු | 6.0 | ජල ගැලීම් තත්‍වයන්ට ඔරොත්තු දේ. ගොක් මැස්සාගේ ජෛව දර්ශ 1 ට ප්‍රතිරෝධිය. ලවනතාවයට මද වශයෙන් ඔරොත්තු දේ. | - |
| බිඩබ් 452 | රතු | 5.0 | පැරණි වැඩි දියුණු කළ වී ප්‍රභේදයකි. නමුත් නයිට්‍රජන් පොහොර වලට උසස් ප්‍රතිචාරයක් දක්වයි. ඇඳවැටීමට ඔරොත්තු දේ. පහතරට තෙත් කලාපයේ නිතරම ජලයෙන් යටවන හා යකඩ විෂවීමේ තත්‍වය සහිත කුඹුරු සඳහාත්, වගුරුමය කුඹුරු සඳහාත් සුදුසුය. | - |
| බිඩබ් 453 | සුදු | 7.0 | යකඩ විෂ වීමට ඔරොත්තු දේ. ගොක් මැස්සාගේ ජෛව දර්ශ 1 ට ප්‍රතිරෝධිය. අධික ලෙස පඳුරු දමයි. කොළ පාළුවට මධ්‍යස්ථ ලෙස ප්‍රතිරෝධියි. | - |

(ඉ) මාස 5-6 වයස් කාණ්ඩය

| ප්‍රභේදය | සහල්වල පැහැය | අස්වනු විභවය හෙක්.ටො. | විශේෂ ගුණාංග | * වර්තමාන බිත්තර වී නිෂ්පාදන වැඩසටහනට ඇතුලත් ප්‍රභේද |
|---|---|---|---|---|
| බිජි 3-5 | සුදු | 5.5 | පඳුරු දැමීම වැඩිය. කොළ පාළුවට ඔරොත්තු දේ. ප්‍රභා අවධි සංවේදී වේ. | B/F |
| බිජි 407 | සුදු | 7.5 | ධාන්‍ය හොඳින් මෝරා ඇති විටදී පවා පත්‍ර සැලකිය යුතු ලෙස කොළ පැහැයෙන් යුක්ත වේ. බැක්ටීරියා කොළ අංගමාරයට ප්‍රතිරෝධිය. ප්‍රභා අවධි සංවේදී වේ. | B/F |
| බිජි 745 | සුදු | 6.0 | මුතු සම්බා සහ පොඩි වී ඒ 8 ප්‍රභේද වලට හොඳ ආදේශකයක් ලෙස සැලකිය හැක. කොළ පාළුවට ප්‍රතිරෝධිය. ඇද වැටීමට පාත්‍ර නොවේ. සහල් මුතු සම්බා ප්‍රභේදයට සමානය. ප්‍රභා අවධි සංවේදී වේ. | B/F |
| බිජි 38 | සුදු | 6 | සම්බා ප්‍රභේදයකි. අධික ලෙස පොහොර වලට ප්‍රතිචාර දක්වයි. කොළ පාළුවට ප්‍රතිරෝධිය. ප්‍රභා අවධි සංවේදී වේ. | B/F |

(ඊ) මාස 2 1/2 වයස් කාණ්ඩය

| ප්‍රභේදය | සහල්වල පැහැය | අස්වනු විභවය හෙක්.ටො. | විශේෂ ගුණාංග | * වර්තමාන බීජ වී නිෂ්පාදන වැඩසටහනට ඇතුලත් ප්‍රභේද |
|---|---|---|---|---|
| බීජී 250 | සුදු | 5 | දුඹුරු පැළ කීඩෑ හානිය හා කොළ පාළුවට ප්‍රතිරෝධී වේ. බැක්ටීරියා කොළ අංගමාරයට මධ්‍යස්ථ ප්‍රතිරෝධී වේ. පැළෑටි ගහනය, පොහොර සහ ජලය සැපයීම අනුව වගාවේ වයස දින කිපයකින් වැඩිවිය හැකිය. ජල හිඟයන් නිසා කන්නය ප්‍රමාද වනවිට වගා කිරීමට යෝග්‍යය. | 2006 යල ආරම්භ වේ. |

* ***තිරුව යටතේ සඳහන් වනුයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තු බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානයේ 2005/2006 මූලික බීජ නිෂ්පාදන වැඩසටහනට ඇතුලත් වී ඇති ප්‍රභේදයන් වේ.***

**B** - අභිජනන බීජ (Breeders' seed) **F** - අත්තිවාරම් බීජ (Foundation seed) **R** - ලියාපදිංචි කළ බීජ (Registered seed)

මාස 5-6 කාණ්ඩ වී ප්‍රභේද වල අත්තිවාරම් බීජ බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් පමණක් නිෂ්පාදනය කෙරේ.

**මූලාශ්‍රය:** *වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බතලගොඩ.*

*බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය, පේරාදෙණිය.*

# සහල් වල පෝෂණ ගුණ

රතු සහල් සුදු සහලට වඩා පෝෂණ ගුණයෙන් වැඩි බව බොහෝ දෙනා අතර පවතින මතයයි. සහල් වලට රතු පැහැය ලැබී ඇත්තේ සහල් නිවුඩ්ඩේ ඇති ඇන්තොසයනින් වර්ණකය හේතුවෙනි. ඇන්තොසයනින් යනු වර්ණකයක් මිස පෝෂණීය අගයයක් නොමැති සංඝටකයකි. රතු සහල්වල රතු පැහැයෙන් ඇති නිවුඩ්ඩ මෙන්ම සුදු සහල් වලද සුදු පැහැයෙන් නිවුඩ්ඩ අඩංගු වේ. මේ නිසා නිවුඩ්ඩේ ඇති පෝෂකයන් රතු සහල් හෝ සුදු සහල් ලෙස වෙනසක් නොමැතිය (වගුව 1 හා 2). කෙසේ නමුත් සහල් සැකසීමේදී සහලේ පෙනුම වැඩිකර ගැනීම සඳහා නිවුඩ්ඩ ඉවත් කරන බැවින් පෝෂණ සංඝටකයන් විශාල ලෙස ඉවත්වී යයි (වගුව 2). සහල් තැම්බීමේදී මෙම ස්ථරයේ ඇති සමහරක් පෝෂක සහල් ඇටය තුළට අවශෝෂණය වන බැවින් සහල් තැම්බීම මගින් පෝෂක වැඩි ප්‍රමාණයක් ආරක්‍ෂා කර ගත හැකිය (වගුව 3).

වගුව 01: වී ධාන්‍යයේ විවිධ කොටස්වල පෝෂණ අගයයන් (g/kg)

| සංඝටකය | නොපාහින ලද සහල් Brown Rice | පාහින ලද සහල් Milled Rice | නිවුඩ්ඩ Bran | Polish | දහයියා Hull |
|---|---|---|---|---|---|
| පිෂ්ඨය (ග්‍රෑ.) | 902 | 722 | 161 | 483 - 554 | 18 |
| ප්‍රෝටීන් (ග්‍රෑ.) | 83 - 96 | 73 - 83 | 132 - 173 | 130 - 144 | 2332 |
| දළ මේදය (ග්‍රෑ.) | 21 - 33 | 4 - 6 | 170 - 229 | 117 - 144 | 4 - 7 |
| දළ තන්තු (ග්‍රෑ.) | 7 - 12 | 3 - 6 | 95 - 132 | 27 - 37 | 401 - 534 |
| දළ අළු (ග්‍රෑ.) | 12 - 16 | 4 - 9 | 92 - 115 | 61 - 85 | 153 - 244 |
| ආහාරමය කෙඳි (ග්‍රෑ.) | 45 | 27 | 276 - 333 | - | 773 |
| නිදහස් සීනි (ග්‍රෑ.) | 8 - 15 | 2.5 - 5.2 | 64 - 65 | - | 7 |
| විටමින් (මයික්‍රෝ ග්‍රෑම්) | | | | | |
| විටමින් A | 0 - 0.13 | ඉතා සුළු ලෙස | 0 - 4.2 | 0 - 1.0 | - |
| තයමින් B1 | 3.4 - 4.4 | 0.2 - 1.3 | 14 - 28 | 20 - 65 | 1.0 - 2.4 |
| රයිබොෆ්ලේවින් B2 | 0.5 - 1.6 | 0.2 - 0.7 | 2.1 - 4.0 | 2.5 - 5 | 2.0 - 2.8 |
| නියසින් B3 | 41 - 58 | 15 - 28 | 330 - 580 | 33 - 96 | 60 - 330 |
| පිරිඩොක්සින් B6 | 0.6 - 1 | 0.12 - 0.14 | 10 - 32 | 15 - 18 | 10 - 22 |
| විටමින් E | 91.3 : 2.9 | ඉතා සුළු ලෙස | 30.5 : 150 | 88 | 63 |
| ඛනිජ ලවණ (මි.ග්‍රෑ.) | | | | | |
| කැල්සියම් | 20 - 60 | 10 - 30 | 40 - 80 | 80 | 150 |
| මැග්නීසියම් | 60 - 180 | 20 - 60 | 600 - 1500 | 800 | 40 |
| පොස්පරස් | 200 - 420 | 90 - 180 | 1400 - 2900 | 1200 - 2500 | 40 |
| පයිලේටි පී | 180 - 300 | 30 - 80 | 1900 : 2500 | 1400 - 2000 | - |
| පොටෑසියම් | 130 - 330 | 80 - 150 | 1200 : 2300 | 800 : 1300 | 180 : 210 |
| යකඩ | 0.18 - 0.6 | 0.06 - 0.33 | 10 - 50 | 5 : 18 | 4.5 - 11.0 |
| සින්ක් | 0.22 - 0.33 | 0.11 - 0.27 | 5 - 30 | 10 : 30 | 1 |
| සිලිකන් | 20 - 30 | 10 - 50 | 300 - 600 | 130 - 190 | 7500 - 11000 |

වගුව 2: නොපාහින ලද රතු සහ සුදු සහල් අතර හා පාහින ලද රතු සහ සුදු සහල් අතර පෝෂණ අගයයන් සැසඳීම

| පෝෂණ සංඝටකය | නොපාහින ලද සහල් | | පාහින ලද සහල් | |
|---|---|---|---|---|
| | රතු | සුදු | රතු | සුදු |
| පිෂ්ඨය % | 75.5 | 75.9 | 90.0 | 89.8 |
| ප්‍රෝටීන % | 7.8 | 8.9 | 6.8 | 6.5 |
| තන්තු % | 0.8 | 0.7 | 0.1 | 0.1 |
| මේදය % | 3.0 | 3.3 | 0.6 | 0.5 |
| විටමින් | High | High | Low | Low |
| තයමින් (μg/g) | 3.7 | 3.6 | 0.5 | 0.6 |
| රයිබොෆ්ලේවින් (ug/g) | 0.52 | 0.53 | 0.21 | 0.20 |
| අළු % | 0.81 | 0.79 | 0.30 | 0.28 |

වගුව 03: තැම්බු සහල් හා කැකුලු සහල් වල පෝෂණ අගයයන් සැසඳීම

| පෝෂණ සංගටකය | කැකුලු සහල් | තැම්බු සහල් |
|---|---|---|
| විටමින් බී(මයික්‍රො ග්‍රෑම්) | | |
| තයමින් | 0.05 | 2.50 |
| රයිබොෆ්ලේවින් | 0.19 | 0.38 |
| නියසින් | 16.40 | 32.17 |
| ඛණිජ (ppm) | | |
| යකඩ | 9.15 | 8.55 |
| සින්ක් | 18.66 | 16.12 |
| පොස්පරස් | 2178 | 2095 |
| ප්‍රෝටීන් (%) | 6.8 | 8.5 |

**2003 වර්ෂයේදී වී ප්‍රභේද ප්‍රචලිත වී තිබූ ආකාරය**

| වයස් කාණ්ඩය මාස | 2003 මහ වගා වපසරිය % | 2003 යල වගා වපසරිය % | ප්‍රභේද |
|---|---|---|---|
| 3 | 21 | 22 | Bg 300 (19%)<br>At 303 (0.85)%<br>Bg 305 (0.82)% |
| 3 1/2 | 65 | 70 | Bg 3%52 (18%)<br>Bg 358 (15%)<br>Bg 94-1 (10%)<br>At 353, Ld 356<br>Bg 359, Bg 357<br>Bg 350, Bg 351<br>Ld 355, Bg 360 |
| 4- 4 1/2 | 12 | 06 | Bg 379-2 (3%)<br>Bg 450 (2%)<br>Bg 403 |

*මූලාශ්‍රය: වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බතලගොඩ.*

# වී වගාවේ බජිරි හෙවත් මාරුක් වල් පැළෑටියෙන් ආර්ථික වාසියක් සහ පාලනයට පහසු ක්‍රමයක්

බොහෝ කුඹුරු සුපරීක්ෂාකාරීව නිරීක්ෂණය කලොත් වී කරල් වලට නොදෙවෙනි ලෙස ඇතැම් කුඹුරු බජිරි (මහ මාරුක්) කරල් වලින් පිරී ඇති බව දැකිය හැක. ලෝකය පුරා බජිරි ශාක විශේෂ 50 කට ආසන්න ප්‍රමාණයක් හඳුනාගෙන ඇති අතර ලංකාවේ කුඹුරු වල පැතිරී ඇති මෙම බජිරි (මහ මාරුක්) උද්භිද විද්‍යාත්මක ශාක විශේෂ දෙකකට අයත් වේ.

*Echinochloa crusgalli* (මහමාරුක්/වෙල් මාරුක්) සහ

*Echinocoloa colonum* (ගොඩ මාරුක්/හීන් මාරුක්)

රට පුරා ව්‍යාප්ත වී ඇති මේ බජිරි ශාකය වී වගා ක්ෂේත්‍රයෙන් ඉවත් නොකළහොත් සිදුවන අහිතකර බලපෑම් රාශියකි.

- මෙම වල් පැළෑටිය ගොයමේ මුල් අවධියේදී ගොයමට යොදන පොහොර, ජලය, ආලෝකය, ඉඩකඩ වැනි සාධක සඳහා වී පැළය හා තරග කිරීම නිසා වී ශාකයේ වර්ධනයට බලපෑම් ඇති වේ.
- තරගකාරීත්වයකින් යුතුව සරුවට වැඩෙන බජිරි කරල් එහි අනාගත පරම්පරාව බිහි කිරීම සඳහා විශාල ලෙස බීජ නිපදවනු ලැබේ. සාරවත් වී කරලක බීජ 150-200 කට සීමා වුවද, බජිරි කරලක බීජ දහසකට අධිකය. බජිරි පඳුරක කරල් 5-15 ක් අතර පවතී. එම බීජ සියල්ලම ඉදිරි කන්න වලදී ගොයමත් සමග නැවත තරග කිරීමට යොදගනී.
- මෙම විනාශකාරී වල් පැළෑටිය පාලනය කිරීමට සඳහා ගොවියාට අමතර වියදමක් දැරීමට සිදුවේ.

අද වී වගාව සඳහා නිර්දේශ කර ඇති වල් නාශක බොහොමයක් මගින් ඉතාමත්ම සාර්ථක අයුරින් වල්පැළ පාලනයක් කළ හැකි වුවද කිසිදු වල් නාශකයක් මගින් 100% ම වල් පැළ පාලනය කළ නොහැකිය. මේ සමග අනෙකුත් වගා ක්‍රම එනම් ජල පාලනය, මනා බිම් සැකසීම, පොහොර යෙදීම, මනා යෙදවුම් තත්ත්ව, දුටු විගස වල් පැළ අතින් හෝ ගලවා ඉවත් කිරීම වැනි ඒකාබද්ධ ක්‍රම මගින් මෙම පාලන කටයුතු සිදුකළ යුතුය. සමීක්ෂණ වාර්තා වලින් පෙන්නුම් කර ඇති පරිදි වල් පැළ පාලන ක්‍රම අනුගමනය කළ කුඹුරුවල වුවද බොහෝ විට වල් පැළෑටි නිසා 10% - 50% පමණ අස්වනු හානියක් සිදුවිය හැක. මේ නිසා දීර්ඝ කාලීනව සාර්ථක ක්‍රමයක් ලෙස බජිරි කරල් ගොයමෙන් ඉවත් කිරීම සාර්ථක ඒකාබද්ධ වල් පැළ පාලනයක් සඳහා අත්‍යාවශ්‍ය වන අතර, එමගින් සිදුවන අස්වනු හානිය ද අවම කර ගත හැක.

වී වගාවන් තුළ හෝ වෙනත් ඕනෑම වගාවක වල් පැළ මර්ධනය කිරීම ඉතා අපහසුය. කළ හැක්කේ වල් පැළ පාලනයකි (Weed control). එනම් පැළවෙන වල් පැළ වල බලපෑම නිසා බෝගයේ අස්වැන්නට හා ගුණාත්මයට බල නොපාන අයුරින් පවත්වා ගැනීමය. වල් පැළ පාලනයට ඉතා පහසු ක්‍රියාවලියකි. ඒවා ප්‍රයෝජනවත් අයුරින් යොදා ගැනීම Weed utilization නමින් හඳුන්වයි. බජිරි ශාකය ගැන සැලකූ විට මෙය ඉතා පහසුවෙන් සිදු කිරීමට හැකි වේ.

මේ අනුව කුඹුරක වල්පැළ පාලනයෙන් පසුව වුවද ඉතිරිවන බජිරි කරල් කුඹුරෙන් ඉවත් කිරීම අනිවාර්යයෙන්ම කළයුතු දීර්ඝ කාලීන වල් පැළෑටි පාලන ක්‍රමයකි. මෙලෙස ඉවත් කරන ලද බජිරි



කරල් වෙනත් ප්‍රයෝජනවත් දෙයකට යොදගත හැකි නම් එය ඉතා පහසු ප්‍රායෝගික ක්‍රමයක් වනු ඇත.

අද අප රට තුළ බොහෝ දෙනෙක් අලංකාරයට සහ සුරතලයට "Love birds" නැමති පක්ෂීන් ඇති කරනු ලැබේ. මොවුන්ගේ ප්‍රධානම ආහාරය වනුයේ බපිරි (මාරුක්) බීජයි. මේ බපිරි බීජ කිලෝ ග්‍රෑම් 01 ක් අද වෙළඳපොලේ රුපියල් 80-100 දක්වා මුදලකට විකිණීම සිදු කරයි. මෙම වියළි ආහාර බොහොමයක් පිටරටවලින් ආනයනය කරනු ලැබේ. මෙම ආනයනික බීජ වල ඇති විශේෂත්වය වනුයේ හොඳින් වියලා පැගීම සිදුකර ඔපවත් (Polish) කර තිබීමය. කෙසේ වුවද, මෙම කුරුල්ලන්ට ආනයනය කරන ලද බීජ සහ දේශීයව නෙලා ගත් බපිරි බීජ වර්ග දෙකම ආහාරය සඳහා ලබාදීමේ දී අපේ නොපාහින ලද බපිරි බීජ කෑමට කුරුල්ලන් වැඩි ප්‍රියතාවයක් දක්වන බව පෙනී ගිය කරුණකි. මීට හේතුව වනුයේ මේ බීජ ඉතා අළුත්වීමත් තරමක කිරි රසයෙන් යුතු වීමත්ය. එබැවින් මේ තරම් පාලනය අපහසු තත්ත්වයකින් අප රට තුළ ව්‍යාප්ත වී ඇති බපිරි බීජ, යාය සංවිධාන මඟින් හෝ එකතු කර මේ සඳහා යොද ගත හැකිනම් එය අපේ ගොවි මහතුන්ට ලබාගත හැකි අමතර ආදායම් මාර්ගයක් වන අතර වී වගාව පිළිබඳව සැලකූ විටද එය දීර්ඝ කාලීන පරිසර හිතකාමී පාලන ක්‍රමයකි. මේ මඟින් වී වගාවේ සිදුවන අස්වනු හානිය ඉතා ඉක්මණින් අවම කරගත හැක. මෙම බපිරි බීජ රැස්කර සහල්, කුරක්කන් වැනි ධාන්‍ය පැහීම සිදු කරන අයුරින් සකස්කර පහසුවෙන් වෙළඳපොලට ලබාදීම කළ හැක. එමඟින් ගොවියාට වාසියක් මෙන්ම අපේ රටින් පිට රටට කුරුළු ආහාර ආනයනය සඳහා වැය වන මුදල් ද ගොවි මහතුන් අතටම පත්කර ගැනීමට හැකිවනු ඇත.

මීට අමතරව මේ ආනයනික බීජ නිසා අපට සිදුවන තවත් ප්‍රධාන හානියක් ඇත. අපේ වී වගාවේ දැනට දක්නට ඇත්තේ බපිරි විශේෂ 02 ක් පමණය. නමුත් මෙම ආනයනය කරන ලද බීජ වෙනත් විශේෂ කිහිපයකින් යුතු බැවින් ද ඒවා බොහොමයක් ජීව්‍යතාවයෙන් යුතු හෙයින් ද පහසුවෙන් එය අපේ වී වගාව තුළ ව්‍යාප්ත වීමේ අවධානමක් ඇත. එසේ වුවහොත් දැනට පාලනය කිරීමට අපහසු තත්ත්වයෙන් පවතින බපිරි නිසා සිදුවන අස්වනු හානිය තවදුරටත් වැඩි විය හැක. ගොයම තුළ ඇති බපිරි පැළ පාලනය සඳහා ජාතික මෙන්ම දීර්ඝ කාලීන පාරිසරික හිතකාමී ඒකාබද්ධ පාලන ක්‍රියාදමයක් අනුගමනය කිරීමෙන් ගොවියාට වාසි රැසක් අත්කර ගත හැක.

අලංකාර මල් සැරසිලි සඳහා පහසුවෙන් හා අඩු වියදමකින් සපයා ගත හැකි ද්‍රව්‍යයක් ලෙස ද නොපැසුනු බපිරි කරල් ප්‍රයෝජනයට ගත හැක.

මෙවැනි කුමන හෝ ක්‍රමයකින් අපේ කුඹුරු වල දැනට සීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතින බපිරි (මාරුක්) ව්‍යාප්තිය සහ එමගින් සිදුවන වී අස්වනු හානිය අවම කරගත හැකිනම් එය පුද්ගලික මෙන්ම ජාතික වශයෙන් ඉතා වැදගත් වේ.

*මූලාශ්‍රය: අනුරුද්ධිකා අබේසේකර, පර්යේෂණ නිලධාරිනී, වල්පැළ විද්‍යා අංශය, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බතලගොඩ, ඉබ්බාගමුව.*

**කෘෂි - තාක්ෂණ ....... ලුහුඬින්**

කාලීන තාක්ෂණික තොරතුරු සංක්ෂිප්තව තාක්ෂණවේදීන්, විශේෂයෙන්ම ව්‍යාප්ති නිලධාරීන් වෙත ලබාදීමේ අරමුණ උදෙසා කෘෂි - තාක්ෂණ පත්‍රිකාව ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය විසින් වරින් වර නිකුත් කරනු ලැබේ. මෙම පත්‍රිකාවේ අඩංගු තොරතුරු බොහොමයක්ම ප්‍රභවය වී ඇත්තේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ ආයතන සහ මධ්‍යස්ථාන වලිනි. තවද, වෙනත් ඕනෑම මූලාශ්‍රයකින් උපුටා ගත හැකිවූද, ක්ෂේත්‍රයේ ප්‍රායෝගිකව යොදාගත හැකිවූද, තොරතුරු වේ නම්, එවැනි දෑ ද කෘෂි - තාක්ෂණ පත්‍රිකාවෙහි අන්තර්ගත වනු ඇත.

*- සංස්කාරක -*

*රචනය හා සංස්කරණය*
**ජයන්තා ඉලන්කෝන්**

වැඩිදුර තොරතුරු සඳහා විමසන්න : අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, තැ.පෙ. 18, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.

කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය මගින් ප්‍රකාශයට පත් කෙරිනි.

# රා.සේ.පි.

මුද්‍රිත ද්‍රව්‍යය
භාර නොදුනහොත් ආපසු යොමු කරන්න:

අධ්‍යක්ෂ,
ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය,
තැ.පෙ. 18,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

මෙම පත්‍රිකාව, පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ පරිගණක අංශයේ පිටු සකස් කර ගන්නෝරුව කෘෂිකර්ම මුද්‍රණාලයේ දී මුද්‍රණය කරන ලදී.

පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
කෘෂිකර්ම, සංවර්ධන අමාත්‍යාංශය

වෙළුම 7 අංක 6 | 2005 නොවැම්බර්-දෙසැම්බර්

# බඩඉරිඟු වගාවට වැළදෙන නව දුඹුරු පුල්ලි රෝගයක්

මෙම රෝගය ප්‍රථමයෙන් වාර්තා වූයේ 2005/2006 මහ කන්නයේදී ගලෙන්බිඳුණුවැව ප්‍රදේශයේ බඩඉරිඟු වගාවලිනි. දෙමුහුම් බඩඉරිඟු ප්‍රභේද සඳහා රෝග පත්‍රිතාව අධික (>50%) විය. එය පත්‍ර තලය, පත්‍ර කොපුව, පත්‍ර නටු වලට ආසාදනය කර තිබූ අතර, මධ්‍ය නාරටි ප්‍රදේශයේ රෝග ලක්‍ෂණ වඩාත් පැහැදිලිව පෙන්නුම් කෙරුණි.

පළමුව ඉතා කුඩා, රවුම් සිට  දිගැටි, කහ පැහැති පුල්ලි ලෙස පත්‍ර තලය මත රෝග ලක්ෂණ දක්නට ලැබේ (රූපය 1). මෙම පුල්ලි පත්‍ර තලය හරහා තීරු ලෙසද ඇතිවිය හැකිය. ආසාදිත පටක පසුව චොකලට් දුඹුරු සිට රතු දුඹුරු පැහැ වන අතර පුල්ලි එකට එකතුවී අක්‍රමවත් කෝණාකාර පෙනුමක් ඇතිවේ (රූපය 2 සහ 3). හිතකර තත්ව යටතේ පත්‍ර කොපුවට ඇතුලතින් ගැටය අසල දරුණු කුණුවීමක් සිදුකරයි.

ආසාදිත පටකවල ඝනකම බිත්ති සහිත දුඹුරු ස්පොරැන්ජියා (කාලතරණ ව්‍යුහ) ඉතා විශාල සංඛ්‍යාවක් අඩංගු වේ. තෙතමනය සහිත තත්ව යටතේ සහ උෂ්ණත්වය සාපේක්ෂව අධික විට (සෙ.අ. $23^0$- $30^0$), මෙම ස්පොරැන්ජියා ප්‍රරෝහනණය වී පාවීමට හැකි සුබීජානු (zoo spores) 20-50 ක් පමණ නිදහස් කරයි. මේවා ජලය ඔස්සේ පාවී ගොස් ශාක පටක මත තැන්පත් වේ.

රෝග ලක්‍ෂණ හා රෝග කාරකයා වෙන් කිරීම මගින් මෙම රෝගය දිලීර රෝගයක් බවත් ව්‍යාධිකාරකයා *Physoderma maydis* ලෙසත් හඳුනාගන්නා ලදි. ආසාදිත පටක කොටස් වලින් නිදහස් කරන ස්පොරැන්ජියා බෝග අවශේෂ වලට හා පසට එකතුවන අතර වාතය, කෘමින්, ජල බිංදු විසිරීමෙන්, ගලායන ජලයෙන් හෝ මිනිසුන් මගින් වෙනත් ප්‍රදේශ කරා ගෙන යයි. නොවැම්බර් - ජනවාරි කාලය තුළ පැවති යෝග්‍ය  දේශගුණික තත්ත්ව හා මෙම රෝගයට ඉතාම පාත්‍ර දෙමුහුම් ප්‍රභේද වන "ජම්බෝ" සහ "පැසිපික්" ප්‍රභේද භාවිතය යන සාධක දෙක මෙම රෝගය එම ක්‍ෂේත්‍රය තුළ වර්ධනයවීම සඳහා ඉවහල් වී ඇති බව පෙනේ. මෙම දිලීරකාරකයා මගින් ඇති කරන රෝගය ශ්‍රී ලංකාව තුළ වාර්තා වූ ප්‍රථම අවස්ථාව මෙය විය. මහ කන්නය තුළ මෙම රෝගයට පාත්‍ර දෙමුහුම් ප්‍රභේද භාවිතයෙන් ශ්‍රී ලංකාවේ බඩඉරිඟු වගාවනට අධික හානියක් ඇති කිරීමේ අවදානම පවතී.

කාලතරන ව්‍යුහ තුළ අඩංගු වි පසේ අවුරුදු 3 ක් පමණ කාලයක් මෙම ව්‍යාධිකාරකයාට ජීවත්විය හැකිවේ. මේ නිසා භෝග මාරුව, භෝග අවශේෂ විනාශ කිරීම රෝග ආසාදන අවම කර ගැනීමට ඉවහල් වන අතර, ප්‍රතිරෝධී ප්‍රභේද භාවිතය රෝගය පාලනය සඳහා ඉතා වැදගත් වේ.

*මූලාශ්‍රය ඩබ්.ඒ.පී.ජී. වීරරත්න, පර්යේෂණ නිලධාරිණී, ක්‍ෂේත්‍ර බෝග පර්: හා සංවර්ධන ආයතනය, මහඉලුප්පල්ලම.*



*රූපය 1*

*පත්‍ර තලය මත හටගත් කහ පැහැති පුල්ලි*



*රූපය 2*



*රූපය 3*

*පත්‍ර නාරටිය මත පෙන්නුම් කළ රෝග ලක්‍ෂණ*

# දූරියන් ශාක පුහුණුව හා කප්පාදුව

දූරියන් ගස ගැන සඳහන් කළ සැණෙකින්ම අපට සිහිපත් වනුයේ උසට වැඩුනු දැවැන්ත වෘක්ෂයකි. ක්ෂේත්‍රයේ ඇති ශාක සියල්ලක්ම පාහේ මෙවැනි ආකාර වන අතර බීජ පැළ මඟින් වගාව ව්‍යාප්තිය එයට ප්‍රධාන හේතුව ලෙස හැඳින්විය හැක. තවද බීජ පැළ මඟින් හටගන්නා ශාක හෙයින් ගෙඩිවල ප්‍රමාණාත්මක හා ගුණාත්මක ලක්ෂණ ගසින් ගසට විචල්‍ය වන අතර, අස්වනු හට ගැනීම ආරම්භ වීම සඳහා ද දිගු කලක් ගතවේ. තවද ඉතා උස් වූ ශාක බැවින් රෝග හා පළිබෝධ පාලනය, මල් කෘතිමව පරාගනය, අස්වනු නෙලීම යනාදී විවිධ කටයුතු දුෂ්කර වී ඇත.

දූරියන් බද්ධ පැළ වගා කිරීමෙන් හා දූරියන් ශාකය කුඩා කළ සිට මනා ලෙස කප්පාදු කර පහසුවෙන් ඵල නෙලිය හැකි ප්‍රමාණයේ ශාක බවට පත්කර ගැනීමෙන් මෙම ගැටළු මඟහරවා ගැනීමට හැකි බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තහවුරු කර ඇත.

කුඩා දූරියන් බද්ධ පැළ ක්ෂේත්‍රයේ සිටුවීමෙන් අනතුරුව රැකබලා ගැනීම ඉතා සුපරීක්ෂාකාරීත්වයෙන් කළ යුත්තකි. වාණිජ වගාවක් සඳහා පේළි 02 ක් අතර පරතරය මීටර් 10 ක් පමණ වන ලෙස බද්ධ පැළ සිටුවීම සුදුසු වේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශිත ආකාරයට පැළ සිටුවා, පළමු වසර තුළ, 70% පමණ සෙවන ලබාදෙන දැලකින් ආවරණය කිරීම පැළයේ වර්ධනය ඉක්මන් කිරීමට හේතු වේ. පැළය සෘජු ලෙස වර්ධනය වීම සඳහා ආධාරකයක් සිටුවීමත්, පසේ තෙතමනය ප්‍රමාණවත් ලෙස පවත්වා ගැනීමත් වැදගත් වේ.

## බද්ධ පැළ කුඩා අවධියේදී කප්පාදු කිරීම

පැළය ක්ෂේත්‍රයේ මනාව සංස්ථාපනය වී ගසේ උස මී. 1 1/2 ක් පමණ වන විට කුඩා අවධියේ කප්පාදුව ඇරඹිය යුතුය.

මුල් අවධියේදී බද්ධ පැළයේ ග්‍රාහකයෙන් අංකුර ඇතිවන අතර ඒවා ඉවත් කළ යුතුය. මේවා අනුජයෙන් ඇතිවන අංකුර වලට වඩා වේගයෙන් වර්ධනය වන බැවින් නිරතුරුව සුපරීක්ෂාවෙන් සිටීම අවශ්‍යය. මූලිකව තනි කඳක් ලෙස ශාකය පවත්වා ගැනීම අවශ්‍ය බැවින් පොළවට ආසන්නයෙන් එන අතු ඉවත් කිරීම වැදගත්ය (රූපය 1). අතු ඉතා ළංව පිහිටි ආලෝකය ඇහිරුණු ශාකයක් ඇතිවීම වැළැක්වීම සඳහා අනවශ්‍ය අතු ඉවත් කළ යුතුය.



*රූපය1*
*පොළොවට ආසන්නයෙන් එන අතු ඉවත් කිරීම*

## අවුරුදු පහක් පමණ වයසැති ශාකයක් කප්පාදු කිරීම

පාර්ශ්වික අතු වර්ධනය උත්තේජනය කිරීම සඳහා පොළොවේ සිට මීටර් 6-7 ක් පමණ උසකින් ගසේ ඉහල කොටස ඉවත් කිරීම සිදු කරයි. දිය රිකිලි, පොළොවට ආසන්න අතු, රෝග පළිබෝධ හානි සහිත හා නිසරු අතු ද මේ අවස්ථාවේ දී ඉවත් කිරීමෙන් සරු ඵලදාවක් සඳහා ගස සකස් කළ හැක. කැපුම් මුනත් දිරායෑම වැළැක්වීම සඳහා "කන්ඩසාන්" වැනි දිලීර නාශකයක් ආලේප කළ යුතුය.

## ඵල හටගන්නා ශාක කප්පාදු කිරීම

සාර්ථක ඵලදාවක් ලබා ගැනීමට නම් දූරියන් ශාකයක් තුළට හොඳින් ආලෝකය ලැබිය යුතුය. මේ සඳහා සෑම වසරකම කප්පාදු කිරීම කළ යුතුය. සාමාන්‍යයෙන් ශාකය වසරකට දෙවතාවක් කප්පාදු කිරීම සිදු කරයි. පළමු කප්පාදුව අස්වැන්න ලබාගත් පසු සැප්තැම්බර්-ඔක්තෝබර් යන මාස වලදී සිදුකරනු ලබයි. එහිදී රෝග හා පළිබෝධ හානි සහිත අතු ද, නිසරු හා වියළුනු අතු ද, දිය රිකිලි හා එකිනෙකට ගැටුනු අතු ද ඉවත් කරයි. ආලෝකය හොඳින් නොවැටෙන සේ ළං ළංව පිහිටි අතු ඉවත් කළ යුතුය (රූපය 2, 4). සාමාන්‍යයෙන් අතු දෙකක් අතර පරතරය සෙ.මී. 40-50 ක් පමණවත් තිබිය යුතුය. විශාල අතු කැපීමේදී ඒවා ආනතව කැපිය යුතු අතර ගස දිරායෑම වැළැක්වීම සඳහා කැපුම් මුනතේ "කන්ඩසාන්" වැනි දෙයක් ආලේප කළ යුතුය (රූපය 3). මෙම කප්පාදුව අවසානයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශිත පොහොර ප්‍රමාණයන් යෙදීමෙන් ශාකය වර්ධනය වීමට සැලැස්විය යුතු වේ.

දෙවන කප්පාදුව, පළමු කප්පාදුව සිදු කොට මාස 1 1/2 - 2 ට පමණ පසුව එනම් නොවැම්බර් හා දෙසැම්බර් මාස වලදී පමණ සිදුකරනු ලබයි. එහිදී වර්ධනය වෙමින් පවතින දිය රිකිලි සියල්ලක්ම ඉවත් කර විවෘත ශාකයක් ඇති කළ යුතුය.



*රූපය 2*
*අනවශ්‍ය අතු ඉවත් කිරීම*

සාමාන්‍යයෙන් තෙත් කලාපයේ මල් හට ගැනීම සිදු වනුයේ පෙබරවාරි - මාර්තු මාස වල වන අතර ඵල නෙලීම සිදුවනුයේ ජුනි - අගෝස්තු මාස වලය. උඩරට අන්තර් කලාපයේ මල් හට ගැනීම සැප්තැම්බර් - ඔක්තෝබර් මාස වල වන අතර ඵල නෙලීම සිදුවනුයේ දෙසැම්බර්, පෙබරවාරි මාස වලයි. මෙම කලාපයේ දේශගුණික රටාව අනුව අවාරයේ ඵල හට ගැනීම සිදුවේ.




*රූපය 3*
***කැපුම් තලය මතුපිට දිලීර නාශක ආලේපය***



*රූපය 4*
***දිය රිකිලි ඉවත් කිරීම***

ඉහත කප්පාදු වලට අමතරව අවශ්‍ය විට ඵල තුනී කිරීම ද වැදගත් වේ. එකම ස්ථානයෙන් ඵල රාශියක් හටගෙන ඇති විට ඒවා සියල්ල ආර්ථික වටිනාකම අඩු කුඩා ගෙඩි ලෙස වර්ධනය වේ. එවැනි අවස්ථාවල ඵල කිපයක් ඉවත් කිරීමෙන් ගුණාත්මයෙන් යුත් මධ්‍යම හෝ විශාල ප්‍රමාණයේ ගෙඩි ලබාගත හැක. මෙසේ වාණිජ වගාවක් සඳහා බද්ධ පැළ ප්‍රභේද කිපයක් යොදා ගැනීම, පුහුණු කිරීම හා කප්පාදුව, පොහොර දැමීම, ඵල තුනී කිරීම යන ක්‍රම අනුගමනය කරමින් හොඳින් නඩත්තු කර ගත් මධ්‍යම ප්‍රමාණයේ ශාක ඇති කර ගැනීමෙන් වෙළෙඳ පොළට යැවිය හැකි ගුණාත්මයෙන් යුතු හොඳ අස්වැන්නක් ලබාගත හැක. අස්වනු නෙලීම ද පහසු කරයි (රූපය 5).



*රූපය 5*
***පුහුණුව හා කප්පාදුව තුළින් ක්‍රමානුකූලව නඩත්තු කළ වගාවක්***

වාණිජ වගාවක් කරා යාමේදී ගොවි මහතුන්ට පෙර තිබූ ගැටළුවක් නම් දුරියන් ප්‍රභේද නොමැතිකමය. මෙයට පිළියමක් ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ගුණාත්මක දුරියන් ප්‍රභේද දෙකක් දැන් හඳුන්වා දී තිබේ. ඒවා නම් මධ්‍යම ප්‍රමාණයේ (කි.ග්‍රෑ. 1.6) ඕවලාකාර ඵල දරණ, මාංශලය තද බවකින් යුත් හා කහ තැඹිලි පැහැයක් ගන්නා **කසුන්** නම් ප්‍රභේදයත්, මධ්‍යම ප්‍රමාණයේ (කි.ග්‍රෑ.1.6) ඕවලාකාර ඵල දරණ, මාංශලය තද බවකින් යුත් හා ක්‍රීම් පැහැයක් ගන්නා **අඹතැන්න** නම් ප්‍රභේදයත්ය. මෙම ප්‍රභේද වල බද්ධ පැළ යොදා ගෙන සාර්ථක වගාවක් ආරම්භ කිරීමට දැන් ගොවි මහතුන්ට අවස්ථාව තිබේ. වාණිජ වගාවකදී ඇට පැළ කරා නොගොස් බද්ධ පැළ යොදා ගැනීම වැදගත් වන අතර, එමගින් අවශ්‍ය ප්‍රභේදයේ ලක්ෂණ සහිත සාර්ථක ඒකාකාරී වගාවක් ඇතිකර ගැනීමේ හැකියාව ඇති වේ. එසේම බද්ධ පැළ බීජ පැළ මෙන් උසට නොවැඩී පොලොවට ආසන්නයේ සිට අතු බෙදුනු මධ්‍යම ප්‍රමාණයේ ශාක ඇති කරන අතර, ඉක්මණින් ඵල දැරීමද සිදුවේ. දුරියන් මල් පරපරාගනය සඳහා වැඩි නැඹුරුතාවක් දක්වන බැවින් ප්‍රභේද එකකට වැඩි ගණනක් යොදා ගෙන ඒවා වගා බිමේ මාරුවෙන් මාරුවට සිටුවීමෙන් අස්වැන්න වැඩි කර ගත හැක. තවද මල් කෘතිමව පරාගනය කිරීම ද අස්වැන්න වැඩිකර ගැනීම සඳහා ඉවහල් වේ.

*මූලාශ්‍රය : අයි. මැදගොඩ, පර්යේෂණ නිලධාරිණී, එම්.ඩී.පී.සී. නාකන්ද මයා*
*උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය*
*ගන්නෝරුව.*

# වාර්ෂික කෙසෙල් වගාවක මොරෙයියන් ඉවත් කිරීමේ ඵලදායී ක්‍රමයක් හඳුනා ගනිමු

වාර්ෂික වගාවක් ලෙස නඩත්තු වන කෙසෙල් වගාවන්වල මවු ශාකයෙන් හටගන්නා මොරෙයියන් ඉවත් කිරීම වර්ධක කාලය තුළ අනුගමනය කළ යුතු වැදගත් හා අත්‍යාවශ්‍ය කාර්යයකි. ගොවීන් විවිධ ක්‍රම මේ සඳහා භාවිතා කරයි. කෙසේ නමුත් මොරෙයියන් හට ගැනීම සඳහා මොරෙයියන් ඉවත් කිරීමේ ක්‍රමයෙහි බලපෑමක් ඇති බව නිරීක්ෂණය වී ඇත. මේ නිසා වඩාත්ම කාර්යක්ෂම හා වියදම් අඩු ක්‍රමයක් හඳුනා ගැනීම සඳහා අඟුණකොළපැලැස්ස මාශ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් පර්යේෂණ සිදු කරන ලදී.

මීටර් 3×1 පරතරයට වගා කළ "නදී" කෙසෙල් ප්‍රභේදයේ මොරෙයියන් ඉවත් කිරීම සඳහා මතුවන මොරෙයියන් පොඩිකර විනාශ කිරීම, මොරෙයියන්ගේ අග්‍රස්ථ මතට භූමිතෙල් මි.ලි.5-8 ක් වත් කිරීම සහ සාමාන්‍ය භාවිතයේ ආකාරයට මොරෙයියන් ගලවා ඉවත් කිරීම යන ක්‍රම 3 අනුගමනය කරන ලදී.

මෙරෙයියන් තලා දැමීමේ ක්‍රමයට නැවත හටගන්නා වූ පැළ ප්‍රමාණය 12-14 ක් පමණ වූ අතර, පැළ ගලවා ඉවත් කිරීමේදී එම ප්‍රමාණය පැළ 3-5 ක් පමණ වන බව නිරීක්ෂය විය. පැළ තලා දැමීමේදී අග්‍රස්ථ අංකුරය විනාශ වන නමුත්, ආහාර සංචිත ඉතිරි වී තිබෙන බැවින් ගුප්ත අංකුර වර්ධනය වේගවත් වීම මෙයට හේතුව ලෙස සැළකිය හැකිය. භූමිතෙල් යෙදුවිට ආහාර සංචිත සමඟ පැළය විනාශ වන බැවින් සාපේක්ෂව අඩු පැළ ප්‍රමාණයක් හටගන්නා නමුත්, මවු ශාකයේ පටක වලට ද හානිවීම සිදුවන හෙයින්, ද්විතික ආසාදන හට ගැනීමේ අවදානමක්ද පවතී.

පැළ ගැලවීමේ ක්‍රමයට මිනිස් දින 34 ක් වැයවන අතර, මොරෙයියන් පොඩි කර දැමීම සඳහා මිනිස් දින 42 ක් අවශ්‍යය. භූමිතෙල් යෙදීම සඳහා මිනිස් දින 30 ක් වැයවන නමුත් භූමිතෙල් සඳහා අමතර වියදමක් දැරීමට සිදුවේ.

මේ අනුව වාර්ෂික වගාවක් ලෙස නඩත්තු වන කෙසෙල් වගාවක මොරෙයියන් ගලවා ඉවත් කිරීම වඩාත් කාර්යක්ෂම ක්‍රමය ලෙස හඳුනා ගන්නා ලදී.

*මූලාශ්‍රය: එස්.එස්. වීරසිංහ, සුමේධා කරුණාතිලක*
*පර්යේෂණ නිලධාරී, මාශ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, අඟුණකොළපැලැස්ස.*

**කෘෂි - තාක්ෂණ ....... ලුහුඬින්**

කාලීන තාක්ෂණික තොරතුරු සංක්ෂිප්තව තාක්ෂණවේදීන්, විශේෂයෙන්ම ව්‍යාප්ති නිලධාරීන් වෙත ලබාදීමේ අරමුණ උදෙසා කෘෂි - තාක්ෂණ පත්‍රිකාව ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය විසින් වරින් වර නිකුත් කරනු ලැබේ. මෙම පත්‍රිකාවේ අඩංගු තොරතුරු බොහොමයක්ම ප්‍රභවය වී ඇත්තේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ ආයතන සහ මධ්‍යස්ථාන වලිනි. තවද, වෙනත් ඕනෑම මූලාශ්‍රයකින් උපුටා ගත හැකිවුවද, ක්ෂේත්‍රයේ ප්‍රායෝගිකව යොදාගත හැකිවුවද, තොරතුරු වේ නම්, එවැනි දෑ ද කෘෂි - තාක්ෂණ පත්‍රිකාවෙහි අන්තර්ගත වනු ඇත.

*- සංස්කාරක -*

*සංස්කරණය*
**ජයන්තා ඉලන්කෝන්**

වැඩිදුර තොරතුරු සඳහා විමසන්න : අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, තැ.පෙ. 18, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.

කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය මගින් ප්‍රකාශයට පත් කෙරිනි.

# රා.සේ.පි.

මුද්‍රිත ද්‍රව්‍යය
භාර නොදුනහොත් ආපසු යොමු කරන්න:

අධ්‍යක්ෂ,
ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය,
තැ.පෙ. 18,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

මෙම පත්‍රිකාව, පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ පරිගණක අංශයේ පිටු සකස් කර ගන්නෝරුව කෘෂිකර්ම මුද්‍රණාලයේ දී මුද්‍රණය කරන ලදී.